සියලුම හිමිකම්ඇවිරිණි/All Right Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

தென் மாகாணக் கல்வித் திணைக்களம்

Southern Provincial Department of Education

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 12 ශ්‍රේණිය**

**තෙවන වාර පරීක්ෂණය 2019 ජූලි**

கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை ஜூலை தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை

General Certificate of Education(Adv.Level) Grade 12 Third Term Test 2019 July

**භූගෝල විද්‍යාව** - II
Geography - II

22 S II

**කාලය පැය තුනයි**
03 hours

**සැලකිය යුතුයි**

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

01.(i)යාබද රූප සටහනෙහි දක්වා ඇත්තේ වායුගෝලීය ස්ථර වේ.එහි උච්ඡත්වය සමග උෂ්ණත්වය පහළ යන ස්ථර **දෙක** නම් කරන්න (ලකුණු 02)




(ii)ජීවයේ පැවැත්ම සඳහා අපරිවර්තීගෝලයෙන් සිදුකෙරෙන දායකත්වය පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 06)

(iii)ජලගෝලයෙහි උප පද්ධතීන් අතර ජලය හුවමාරුවන ආකාර තුන දක්වමින් ජලගෝලයෙහි ක්‍රියාකාරිත්වය විස්තර කරන්න (ලකුණු 06)

(iv)භෞම පද්ධතියේ උප පද්ධතීන්වල විසංතුලනයන් ඇතිවීම කෙරෙහි බලපාන අහිතකර මානව ක්‍රියාකාරකම් **තුනක්** විස්තර කරන්න (ලකුණු 06)

02.(i)පහත A සහ B ලෙස දක්වා ඇත්තේ විපරීතකරණය හේතුවෙන් නිර්මාණය වන පාෂාණ වර්ග දෙකකි. ඒවා නිර්මාණය කෙරෙහි බලපාන මුල් පාෂාණ පිළිවෙළින් නම් කරන්න

A නයිස් B ක්වාට්සයිට් (ලකුණු 02)

(ii) පාෂාණ නිර්මාණ ක්‍රියාවලියේ දී පෘථිවි අභ්‍යන්තරයෙහි සිදුවන පාෂාණ නිර්මාණ උප ක්‍රියාවලින් **දෙකක්** විස්තර කරන්න (ලකුණු 06)

(iii)පාංශු නිර්මාණ ක්‍රියාවලියේ දී දේශගුණය සහ භූ විෂමතාව ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න (ලකුණු 06)

(iv) පාංශු සංරක්ෂණයේ වැදගත්කම කරුණු **තුනක්** මගින් පෙන්වා දෙන්න (ලකුණු 06)

03.(i) යාබද සිතියමෙහි P සහ Q ලෙස දැක්වෙන ප්‍රධාන හා අප්‍රධාන භූ තැටි පිළිවෙළින් නම් කරන්න (ලකුණු 02)




(ii)භූ තැටි චලනය වන ආකාර රූප සටහන් ආධාර කර ගනිමින් විස්තර කරන්න (ලකුණු 06)

(iii) a.පහත දී ඇති භූ රූප ආතතිය හා සම්පීඩන චලන අනුව වෙන් කොට දක්වන්න

1.සමමිතික නැම්ම
2.සුවිභේදය
3.උලැගි නැම්ම

b.මෙම භූ රූපවල නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාර කරගනිමින් විස්තර කරන්න (ලකුණු 06)

(iv)භූමි කම්පාවක් පිළිබඳව පහත දී ඇති ශීර්ෂ යටතේ කෙටියෙන් විස්තර කරන්න

1.භූමි කම්පාවක් හටගැනීම
2.භූ කම්පන තරංග ව්‍යාප්තිය
3.භූ කම්පන මිණුම් කිරීම (ලකුණු 06)

04.(i)පෘථිවියේ මහාද්වීපික ග්ලැසියර් ව්‍යාප්ත ප්‍රදේශ **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(ii)ග්ලැසියර් ප්‍රදේශ වල භූ රූප නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ඛාදන ක්‍රියාවලීන් **තුන** විස්තර කරන්න (ලකුණු 06)

(iii)පහත දී ඇති ග්ලැසියර් භූ රූප දී ඇති නිර්ණායක යටතේ වර්ගකොට ඒවායේ නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් සහිතව විස්තර කරන්න

**නිර්ණායක** ඃ නිම්න ග්ලැසියර් නිධිසාධනය මහාද්වීපික ග්ලැසියර් ඛාදනය

**භූ රූප** ඃ මොරේන, විෂමප්‍රාන්තහෙල, ෆියෝඩ වෙරළ (ලකුණු 06)

(iv)පහත දක්වා ඇති භූ රූප නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන නග්නීකරණ කාරක වෙන් වෙන්ව නම් කර මෙම භූ රූප නිර්මාණය වීම කෙරෙහි ඔබ ඉහත දැක් වූ නග්නීකරණ කාරකවල ක්‍රියාකාරිත්වය විස්තර කරන්න







(ලකුණු 06)

## II කොටස  මානුෂ භූගෝල විද්‍යාව




05.(i)යාබද සිතියමෙහි දක්වා ඇත්තේ ලෝකයේ ජනාධික කලාප වන නැගෙනහිර ආසියාව සහ අග්නිදිග ආසියාවයි.
එම කලාපවල පිහිටි X, Yලෙස නම් කර ඇති රටවල් නිවැරදිව පිළිවෙළින් දක්වන්න (ලකුණු 02)

(ii)ප්‍රාථමික,ප්‍රසාරණ සහ හායන පිරමීඩ සහිත රටවල හඳුනාගත හැකි ජන විද්‍යාත්මක ගැටළු **එක** බැගින් විස්තර කරන්න (ලකුණු 06)

(iii)ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් අධික ජන සංඛ්‍යාව හේතුවෙන් මුහුණ දෙන ගැටළු අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

(iv)ශ්‍රී ලංකාවේ වර්තමානයේ උද්ගතව ඇති ජනවිද්‍යාත්මක ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

06.(i) සරණාගතයින් සහ අවතැන් වූවන් අතර වෙනස පැහැදිළි කරන්න (ලකුණු 02)

(ii)ජන සංක්‍රමණවලට හේතුවන තල්ලු කිරීමේ සාධක **දෙකක්** සහ ඇද ගැනීමේ සාධක **එකක්** විස්තර කරන්න (ලකුණු 06)

(iii)ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණවල දී වැඩිම ආකර්ෂණයක් සහිත පළාත බස්නාහිර පළාතයි. එයට හේතු වූ සාධක **තුනක්** විස්තර කරන්න (ලකුණු 06)

(iv)ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තරයට සිදුවන ශ්‍රම සංක්‍රමණය හේතුවෙන් මෙරට ආර්ථික සංවර්ධනයට වන බලපෑම කරුණු **තුනක්** මගින් සාකච්ඡා කරන්න (ලකුණු 06)

07.(i) ආකීර්ණ ජනාවාසයක් යන්න හඳුන්වන්න (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ජනාවාසකරණ වැඩ සටහන් **දෙකක්** පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 06)

(iii)නාගරික ප්‍රදේශ වලින් ආරම්භ වී ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්තවන නාගරීකරණයේ සාධනීය අංශ **තුනක්** පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 06)

(iv)ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල පහසුකම් කළමණාකරණයේ දී මුහුණ දෙන ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

08.(i)හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික තාක්ෂණය ක්‍රියාත්මක වූ අංශ **දෙක** නම් කරන්න (ලකුණු 02)

(ii)ඔබ ඉහත සඳහන් කළ අංශ කෘෂිකාර්මික සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වූ ආකාරය පිළිබඳව කරුණු **තුනක්** මගින් විමසීමක් කරන්න (ලකුණු 06)

(iii)ජෛවීය කෘෂිකර්මය යන්න හඳුන්වා වර්තමානයේ ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු වීම කෙරෙහි බලපා ඇති හේතු සාධක **තුනක්** විමසන්න (ලකුණු 06)

(iv)තවදුරටත් හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික ක්‍රමවේද ඉදිරියට ගෙන යෑම තුළින් අතිවිය හැකි පාරිසරික ප්‍රතිවිපාක **දෙකක්** සහ සාමාජයීය ප්‍රතිවිපාක **එකක්** විස්තර කරන්න (ලකුණු 06)